

# පෙරදිග සංගීතය - 6 ශ්‍රේණිය.

| | |
|---|---|
| 3.0 | සංගීත රසාස්වාදයෙන් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්වයන් ලගා කරගැනීමට හුරුවෙයි.<br><br>3.1 ගීත රසාස්වාදයේ යෙදෙයි. |

- ගුරුවරයා නිර්මාණය කළ ළමා ගීත ගායනය.
- ළමා ගීත රසාස්වාදය ( බස රිද්මය සහ තනුවේ ස්වභාවය විමසමින්)


Copyright © e-thaksalawa.moe.gov.lk





Copyright © e-thaksalawa.moe.gov.lk

# ළමා ගීත පිළිබඳ විශේෂ කරුණු

ළමයින් සඳහාම ගැලපෙන අයුරින් නිර්මාණය කර ඇති ගීත ළමා ගීත නම් වේ.

ළමා ගීත ගායනය තුලින් කුසලතා පූර්ණ ගායක ගායිකාවන් නිර්මාණය වීමට අත්වැලක් සැපයේ .

සරල පද මාලා සහ සරල නාද මාලාවන් යොදා ගැනීම ළමා ගීත වල දැකිය හැකි විශේෂ ලක්ෂණයකි .

ළමා ගීත ළමා මනසට ගැලපෙන තේමා අනුව නිර්මාණය කර ඇත .

සෑම විටම මෙම ගීත වල මුල් ගායනයේ නාද මාලාවන් රැකෙන සේ ගායනය කළ යුතුය .


Copyright © e-thaksalawa.moe.gov.lk

# ළමා ගීත රචකයින්

චන්ද්‍රරත්න මානවසිංහ මහතා

ටිබෙට් ජාතික s .මහින්ද හිමි

මුණිදාස කුමාරතුංග මහතා

අරිසෙන් අහුබුදු ශූරීන්

කරුණාරත්න අබේසේකර මහතා


Copyright © e-thaksalawa.moe.gov.lk

# ළමා ගීත ප්‍රචාරය සඳහා ගුවන් විදුලියෙන් සහ රූපවාහිනියෙන් විකාශනය වන ළමා වැඩසටහන්

- ගී මල් යාය
- සමනළ උයන
- ළමා පිටිය
- ළමා මණ්ඩපය
- හපන් පැදුර


Copyright © e-thaksalawa.moe.gov.lk

# දණගාද්දි ඇවිදින්නට මට අත දුන්න



## දණ ගාද්දි ඇවිදින්නට

දණගාද්දි ඇවිදින්නට මට අත දුන්න
ගුරු හරුකම් හොඳ නොහොඳත් කියලා දුන්න
මහලුව බැරි උනාම ඔබ හට ඇවිදින්න
අත දෙන්නම් තාත්තේ වන්දි ගෙවන්න

ලෙඩක් දුකක් හැදුනාමත් ලඟම දැවටෙන
උකුල් තලේ උරේ තබා නටා නලවන
සුරංගනා කතා කියා කතා පවසන
අතත් හිතත් මොටද මගේ ඔබට නොවදින

වැල් ඇඳ උඩ වාඩිවෙලා රැවුල පැහෙන දා
මම තරුණෙකි කවදා හෝ එය ඉටුවන දා
දෙපා නැමද බුලත් අතින් තෑගි ගෙනෙන දා
ඔබේ ඇසට කඳුළු නැගෙයි එදා නොවර දා

# හිනැහේවී බෝනික්කා ඇස් නටවා බල බලා



## හිනැහේවී බෝනික්කා

හිනැහේවී බෝනික්කා
ඇස් නටවා බලබලා
නැලවීලා මා උකුලේ
දොයි දොයි දොයි දොයි බබා

ජපන් රටේ උපත ලබා ලංකාවට ආවා
ලස්සන හැඩරුව හින්දා අම්මා ගෙන ආවා
උපන්දිනේ මා සරසා තෑග්ගකට දුන්නා
මගෙ ලස්සන බෝනික්කා හිනැහේවී බලබලා
නැළවීලා මා උකුලේ දොයි දොයි දොයි දොයි බබා

මල් ගවුමක් අන්දාලා නලලට තිලකය තියා
තෝඩු දෙකක් කනට දමා අතට වලලු දාලා
ගමේ ළමෝ දුව ඒවී සෙල්ලම් කෙරුමට කියා
මගෙ ලස්සන බෝනික්කා හිනැහේවී බලබලා
නැළවීලා මා උකුලේ දොයි දොයි දොයි දොයි බබා...


Copyright © e-thaksalawa.moe.gov.lk

# කොන්ඩෙ දිගට දාලා හැම උදේම එනවා

## කොණ්ඩෙ දිගට දාලා

කොණ්ඩෙ දිගට දාලා
හැම උදේම එනවා
පාට පාට මල් වැටිච්ච
සාරි අඳිනවා
පොත් මිටියයි කුඩෙයි අතේ
නැහැ වරදින්නේ
එයාට අපි ටීචර් කියලයි අමතන්නේ

අපෙ පංතියෙ ළමයි එක්ක
ඇ හරි යාළුයි
ඇ පාසල් නාවදාට පංතිය පාළුයි
ගමරාලගෙ කතාවටයි අපි හරි ආසා
කවදාවත් නෑ පංතියෙ කරන්නෙ ගෝසා

සිනා ගෙනෙන කතා තමයි
ඇ පවසන්නේ
ආදරයෙන් සැමදා අපහට සලකන්නේ
ඇය අසලම ගැවසෙන්නට අපි හරි ආසයි.
මේ පංතිය දමායන්න අපි හරි ලෝභයි.


Copyright © e-thaksalawa.moe.gov.lk

# අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි

## අම්මා මාව දොයි කරන්න

අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි
හබුන් කටයි කියාලා බත් දෙකටක් කවාලා
වතුර ටිකක් පොවාලා උකුල උඩින් තියාලා
අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි

අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි
දොයි දොයි කියලා බයි බයි ගයාලා
සැනසිල්ලේ හිතාලා තැලවිල්ලක් ගොතාලා
අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි

අම්ම මාව දොයිකරන්න හදපූ හැටි අගෙයි
ඔන්න බබෝ ඇතින්නී ගල් අරඹේ සිටින්නේ
ගලින් ගලට පනින්නී බබුට බයේ දුවන්නී
අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි

අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි
හොඳ එළියක් පෙනෙන්නේ හඳ මාමයි එබෙන්නේ
කිරියි පැණියි ගෙනෙන්නේ මගෙ දුවටත් බෙදන්නේ
අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි



එල්.පී.කපිල පතිරත්න - හිරි/ඉංගරදවුල ගැමුණු ම.ම.වි. නාරංගොඩ.
Copyright © e-thaksalawa.moe.gov.lk

# ආදරේ ඇයි පොඩි හඳ මාමේ

## ආදරේ ඇයි පොඩි හඳමාමේ

ආදරේ ඇයි පොඩි හඳ මාමේ
ඔබට මෙතරම් දරුවෝ
හඳමාමේ

කිරි පැණි මට ගෙනැවිත් දෙන්කෝ
හීන් සැරේ හඳ මාමේ
ගී කියා ඔබටයි අමතන්නේ
මේ පුංචි නංගා ඔබගේ
හඳමාමේ

ඉවුර දෙසිනී තිසාවැවේහී
සුළඟ ඒය හමාලා
එන්න යන්නට අපි හඳමාමේ
තිසා වැවේ වැව රවුමේ
හඳමාමේ




Copyright © e-thaksalawa.moe.gov.lk

# මට මෑණි වගේ මට පියා වගේ





## මට මෑණි වගේ

මට මෑණිවගේ - මට පියා වගේ
මට ආදර මගෙ ලංකා
ආගමට මගේ - ජාතියට මගේ
මට හෙවනයි සිරි ලංකා ........ //

අපි දරු දූරියෝ - මුළු ඉතිහාසේ
ලොව දිනුවා සේ - ජය ජය ශ්‍රී ලංකා
අප පොඩි දරුවෝ - දින දින බැබලී
මතු රජ වෙන සිරි ලංකා


අපි දරු දූරියෝ - අපි සොහොයුරියෝ
අපි සොහොයුරියෝ - එක මව් සෙවනේ ලංකා
අපි වැඩිහිටියෝ - හැම එකමුතු වී
මැව් මවු රට සිරි ලංකා
මට මෑණි වගේ ...............





Copyright © e-thaksalawa.moe.gov.lk

# කුරුම්බැට්ටි මැෂිමේ



## කුරුම්බැට්ටි මැෂිමේ

කුරුම්බැට්ටි මැෂිමේ
මගේ කුරුම්බැට්ටි මැෂිමේ
ගවුම් පොඩිත්තක් මහලා ඕනෑද
කමිස පොඩිත්තක් මහලා ඕනෑද

කුරුම්බැට්ටි මැෂිමේ ............

කොස් කොළයක්
මෙහෙ අරගෙන ආවොත්
රැලි රැලි කපලා ඔපනැලි තියලා
ගවුම් පොඩිත්තක් මහලා දෙන්නම්
කුරටු ඉදිකටුවෙන් හිල් විදලා
ලේන්සු පොඩියක් මල් මල් සායක්
කොස් කොළ රෙද්දෙන් මහලා
දෙන්නම්

කුරුම්බැට්ටි මැෂිමේ ............


Copyright © e-thaksalawa.moe.gov.lk

## සීනි කෝපි තේ කිරිතේ

සීනි කෝපි තේ කිරිතේ
වෙරළු මසන් ජම නාරං
කොස් දෙල් පොල් මිරිස් ගන්න
එන්න එන්න ........ //
මෙන්න අපේ සීනිබෝල හෝටලේ ....... සීනිබෝල හෝටලේ ....... //

පොඩි බණ්ඩයි මුදලාලියි
ගණන් ලියයි පොඩි හාමියි
පිගන් කෑලි සල්ලි අරන්
එන්න එන්න ........ //
මෙන්න අපේ සීනිබෝල හෝටලේ ....... සීනිබෝල හෝටලේ ....... //

බයිසිකලෙන් කාර් එකෙන්
අශ්ව කරත්තෙන් ආවත්
එක මේසෙ කෑම කන්න
එන්න එන්න ........ //
මෙන්න අපේ සීනිබෝල හෝටලේ ....... සීනිබෝල හෝටලේ ....... //


Copyright © e-thaksalawa.moe.gov.lk

# කොටුවැටිච්ච පුංචි සරම

## කොටු වැටිච්ච

කොටු වැටිච්ච පුංචි සරම
ඇඳන් නටන මල්ලියා
ගෙදර නිතර දඟර කරන
පුංචි මල්ලියා
මගේ මල්ලියා සුරකලා චන්ඩියා .......... //

සෙල්ලම් ගෙයක් මා විනෝදෙන් හදයි
එවා කඩා පෙරලලා දමා දුවයි
සීනි බෝල කන්න සල්ලි ඉල්ලලා හඬයි
වසයි හරි දඟයි මල්ලියා හරි හොඳයි

කොටු වැටිච්ච ................

පාසල් ගොසින් බෑගයක් අතින් අරන්
ගල් කුරයක් අරන් ඇවිත් ලඟින් ඉඳන්
පුංචිකමට පුංචි ගීත කියයි ආදරෙන්
නටයි සන්තොසින් මල්ලියා රත්තරං

කොටු වැටිච්ච ................


Copyright © e-thaksalawa.moe.gov.lk

# මිදුලේ වැලි මාළිගාවෙ

## මිදුලේ වැලි මාලිගාවෙ

මිදුලේ වැලි මාලිගාවේ
සක්විති පදවිය ලබන්න
ගල් වැට ලඟ වාඩිවෙලා
සඳ පායන හැටි බලන්න.
සතර දිසා ජයගෙන මම හතික එමි
ඔබේ ලොවට සඳ හිරු වී එලිය දෙමි.

පීනා සිප් සයුරු එතෙර සියල් සතර දැන පිරිසිඳ
ලොවේ අනෙක් අවමන් මැද නොසෙල් වෙමි
මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමි.

මිදුලේ වැලි මාලිගාවේ ............

එපා ඔටුනු මගේ සිරසට
එපා සිහසුනක් හිඳිනට
සිනා සිසී මා එන මග හිඳිනු මැනේ
දුවේ කියා මා අමතන් පියාණනේ

මිදුලේ වැලි මාලිගාවේ ............


Copyright © e-thaksalawa.moe.gov.lk

# ටක් ගානව ටික් ගානව

## ටක් ගානවා ටික් ගානවා

ටක්ගානව ටික් ගානව
ටිකක් කනවා දොර වහනව
හුණු කිල්ලොටයක් අරගෙන
සීය බුලත්විට හපනව
අනේ සීයෙ අමල්බිසෝ
කතන්දරේ කියන්නකෝ

ජැංඩි පහට සරම ඇඳලා
ඉණ වට හවඩියක් බැඳල
පුංචි අපට ආස හිතෙන
ඉස්සර රස කතා කියන
ගෙයි පිල උඩ පැදුර එලන්
සීයා හරි සැපට ඉඳන්

පෝයදාට සිල් අරගෙන
තිස්සෙම බණ පද අහන්න
රැට රැට දොම් දොම් කිට
පුංචි රබන් පද අහන්න
ගෙයි පිල උඩ පැදුර එලන්
සීයා හරි සැපට නිදන්

එල්.පී.කපිල පතිරත්න - හිරි/ඉංගරදවුල ගැමුණු ම.ම.වි. නාරංගොඩ.
Copyright © e-thaksalawa.moe.gov.lk

# මොනවද මුත්තේ මොකද කරන්නේ

## මොනවද මුත්තේ

මොනවද මුත්තේ මොකද කරන්නේ
මොකටද ඔබ ඔය බිම හාරන්නේ

ඔබටත් ළමයෝ නොපෙනෙයි නොසිතමි
අඹ ඇටයක් සිටුවන්නට හාරමි .............

දූක සේ සිටුවා අඹ ඇටයක් අද
එක අඹයක් වත් කන්න ලැබේවිද?

පුදුමයි ළමයෝ ඔබෙ ඔය අදහස
වැඩුනොත් එහෙමට ඔබටම වෙයි දොස .............
පෙර උන් අය සිටවූ අඹගස් වල
එලයෙන් අපි කවුරුත් ලබනෙමු පල
අපෙන් පසුව එන අයටත් එම පල
ලැබෙන්න සැළසුම අපගේ යුතුකම

ඒ යුතුකම හොඳ හැටි දැන ගත්තෙමි
ආයුබෝවන් මුත්තේ මම යන්නෙමි.


Copyright © e-thaksalawa.moe.gov.lk